# ආත්ම අනාත්ම හා සංකල්ප

අනාත්මවාදයක් සංකල්පීයව හා ප්‍රවාදාත්මක ව තහවුරු කිරීමට උත්සාහ කළ අසංග හා වසුබන්ධු යන භික්‍ෂූන් වහන්සේ ආත්මවාදයක් බිහිකිරීම පුදූමයක් නො වේ. අනාත්ම යනු සංකල්පයක් නො වේ. අනාත්ම යන වචනය යොදාගත් පමණින් සංකල්පයක් නො ලැබෙයි. (වචනවලින් සංකල්ප පමණක් නිරූපණය නො වෙයි.) එහෙත් එයින් කියැවෙන්නේ ආත්මයක් ඇති බව හෝ නැති බව හෝ නොවේ යැයි කීම සංකල්ප යනු කුමක් දැයි නොදැනීම නිසා සිදූවන්නකි.

අනාත්ම අනිත්‍ය නිවන සංකල්ප නොවූ නමුදු ආත්ම නිත්‍ය සංසාරය ආදිය සංකල්ප විය. මහායානික භික්‍ෂූන් වහන්සේ මෙන් ම මෑත යුගයේ බිහි වූ මාර්ටින් වික්‍රමසිංහ මහතා වැන්නෝ ද සංකල්ප හා අසංකත අතර වෙනස තේරුම් නො ගත්හ. අනාත්ම යනු ආත්ම යන්නෙහි විරුද්ධාර්ථයවත් නිවන යනු සංසාරයෙහි විරුද්ධාර්ථයවත් නො වේ. ආත්මය හා සංසාරය සංකල්ප වන අතර අනාත්ම හා නිවන සංකල්ප නො වේ.

නාගර්ජුනපාදයන් වහන්සේ තේරුම් නොගත් ප්‍රධාන කරුණ වූයේ එය යැයි මම සිතමි. උන්වහන්සේ සසරට සාපේක්‍ෂව නිවන ද නිවනට සාපේක්‍ෂව සසර ද ගත්හ. බැලූ බැල්මට එහි පදනමක් ඇතැයි සිතෙයි. අඳුරට සාපේක්‍ෂව එළිය හා එළියට සාපේක්‍ෂව අඳුර ගන්නාක් මෙන් සසරට සාපේක්‍ෂව නිවන ගත නොහැක්කේ ඇයි දැයි කිසිවකුට ඇසිය හැකි ය. එහෙත් මෙහි දී අඳුර හා එළිය යන දෙක ම සංකල්ප බව ද එහෙත් සසර සංකල්පයක් වූ නිසා ම නිවන සංකල්පයක් නොවන බව ද තේරුම් ගත යුතු ය.

නිවන යනුවෙන් වචනයක් තිබීමෙන් ඒ සංකල්පයක් වන්නේ නො වේ. නිවන, අනිත්‍ය, අනාත්ම යනු සංකල්ප නො වේ. ඒ සංකල්ප නම් වෙනත් සංකල්ප තේරුම් ගන්නා අයුරින් ම අපට අනාත්ම, අනිත්‍ය, නිවන තේරුම්ගත හැකිවිය යුතු ය. අනිත්‍ය යනු වෙනස් වීම, එසේත් නැතහොත් නිත්‍ය නොවීම නම් වෙනස්වීම යන්න තේරුම් ගත් විගස අපට අනිත්‍ය තේරුම් ගැනීමට ද, ඒ තේරුම් ගැනීම ඔස්සේ නිවන් අවබෝධ කිරීමට ද හැකි විය යුතු ය. එහෙත් ඒ එසේ නොවන බව අපි දනිමු.

අඳුරට සාපේක්‍ෂව එළියත් එළියට සාපේක්‍ෂව අඳුරත් තේරුම් ගැනීම හේතුවෙන් අඳුරත් එළියත් යනු දෙකක් නොව එකක් ලෙස ගැනීමට නාගර්ජුන හිමියන්ට හැකි විය. අඳුරෙහි එළියත් එළියෙහි අඳුරත් ඇතැයි උන්වහන්සේ දෙසූහ. අඳුරත් එළියත් සංකල්ප බැවින් එසේ කිරීමේ අපහසුවක් නො වී ය. එහෙත් සසරට සාපේක්‍ෂව නිවනත් නිවනට සාපේක්‍ෂව අඳුරත් ගැනීමට නොහැකිවාක් මෙන් ම ඒ දෙකම එකක් ලෙස ගත හැකි ද නො වේ. නාගර්ජුනපාදයන් වහන්සේ කළ ප්‍රධාන ම වරද ඒ යැයි මම සිතමි.

මාර්ටින් වික්‍රමසිංහ මහතා වැන්නෝ එයට වඩා සරල මට්ටමේ අදහස් දැරූහ. ඔවුන්ගේ අදහස අනෙක් දිශාවට ගිය එකක් විය. ආත්මයක් නැතැයි කීම වරදක් යැයි ඔවුහු සිතූහ. ආත්මයක් නැතැයි කීමෙන් ආත්මයක් ඇතැයි යනුවෙන් ගැනීමක් ද වේ ය යන්න ඔවුන්ගේ මතය විය. ඔවුන් කියා සිටියේ ආත්මයක් ඇතැයි යනුවෙන් ගැනීම මෙන් ම ආත්මයක් නැතැයි යනුවෙන් ගැනීම ද වැරදි බව ය.

ආත්මයක් නැතැයි යන්නෙහි තේරුම ආත්මයක් ඇතැයි යනුවෙන් ගැනීම වැරදි බව ය. අපි ඇතැම් විට මෙතැන ගෙයක් නැතැයි කියමු. ඉන් කියැවෙන්නේ මෙතැන ගෙයක් ඇතැයි කීම වරදක් බව ය. මෙහි දී මෙතැන යනු හිස් ඉඩමක් විය හැකි ය. එසේත් නැත්නම් විවිධ වර්ගවල ගස් වැවුණු ඉඩමක් විය හැකි ය. හිස් ඉඩමක් පෙන්වා හෝ පොල් ගසක් හෝ හස් කිහිපයක් හෝ පෙන්වා හෝ මෙතැන ගෙයක් නැතැයි කීමෙන් මෙතැන ගෙයක් ඇති බවක් ගම්‍ය නො වෙයි.

එහෙත් යමකුට මෙසේ ඇසිය හැකි ය. මෙතැන ගෙයක් නැතැයි කීමෙන් කලකට පෙර මෙතෑන ගෙයක් තිබුණු බව හෝ මෙතැන ගෙයක් නැතිවුව ද අතන ගෙයක් ඇති බව හෝ ගම්‍ය නොවන්නේ දැයි ඇසිය හැකි ය. ඉන් කියැවෙන්නේ අද

© Prof. Nalin De Silva

මෙතැන ගෙයක් නැති වුවත් වෙනත් අවස්ථාවක මෙතැන ගෙයක් තිබූ බව හෝ අද වෙනත් තැනක ගෙයක් ඇති බව ය. එහෙත් ආත්මයක් නැතැයි යන්න එලෙස කාලයකට හා භූමියකට සීමා වූ ප්‍රකාශයක් නො වෙයි. ආත්මයක් නැතැයි කීම සියළු කාලයට හා සියළු භූමිවලට පොදු ය.

ආත්මයක් නැතැයි යන්නෙන් කිසියම් වූ කාලයක කිසියම් වූ භූමියක (දේශයක, ලෝකයක) ආත්මයක් ඇතැයි යනුවෙන් හැඟීම වැරදි බව කියැවෙයි. එබැවින් ආත්මයක් නැතැයි යනුවෙන් කීම මෙතැන ගෙයක් නැතැයි කීමට වඩා වෙනස් ය. ආත්මයක් නැතැයි යනුවෙන් කීම සංසන්දනය කළ හැක්කේ ගෙයක් නැතැයි යනුවෙන් කීමට ය. ගෙයක් නැතැයි යනුවෙන් කීමෙන් ගෙයක් ඇතැයි යනුවෙන් සාධාරණ ව ගැනීම වැරදි බව කියැවෙයි. ඉන් කියැවෙන්නේ ගෙය යන සංකල්පය ම වැරදි බව ය. ගෙය යන සංකල්පය ම වැරදි බව කීමෙන් ගෙය යන සංකල්පය ඇතැයි නො කියැවෙයි.

ආත්මයක් නැතැයි කීම යනු මෙතැන පුද්ගලයෙක් වේ යැයි කීමට වඩා වෙනස් ය. මෙතැන පුද්ගලයකු නැතැයි කී විට එතැන පුද්ගලයෙහ් වේ යැයි කීමට ඉඩ ඇත. එහෙත් ආත්මයක් නැතැයි කීමෙන් එතැන හෝ මෙතැන හෝ වෙනත් තැනක හෝ පුද්ගලයකු ඇතැයි යනුවෙන් ගැනීම වැරදි බව කියැවෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා වැන්නන්ට එවැනි සියුම් වෙනස්කම් නොතේරීම පුදුමයක් නො වේ. ඔවුන්ගේ පුහුණුවෙන් එවැනි වෙනසක් දැකීමට ඔවුන්ට නුගැන්වෙයි.

මෙහි දී වැදගත් වන්නේ වියුක්ත සංකල්ප හා සංයුක්ත සංකල්ප අතර ඇති වෙනස ය. සියළු සංකල්ප අපේ නිර්මාණ වෙයි. සංකල්පයක් වචනයකින් දැක්වීම අනිවාර්ය නො වේ. චිත්තරූප ද සංකල්ප විය හැකි ය. විශේෂයෙන් ම භාෂාවක් නොදත් ළදරුවෝ චිත්තරූපයක් හෝ වෙනත් එවැන්නක් හෝ සංකල්පයක් සඳහා යොදා ගනිති. අනෙක් අතට සෑම වචනයක් ම සංකල්පයක් විය යුතු නො වෙයි. නිවන, අනිත්‍ය, අනාත්ම ඒ සඳහා උදාහරණ වෙයි. සංකල්ප නොවූ නිවන, අනාත්ම වියුක්ත හෝ සංයුක්ත හෝ සංකල්ප නොවන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

ආත්ම පුද්ගලාත්ම ධර්මාත්ම යනුවෙන් වර්ග දෙකකට වෙන්කළ හැකි ය. පුද්ගලාත්ම යන්නෙන් පුද්ගලයන්ගේ ආත්ම හැඳින්වෙයි. මේ පුද්ගලයන් මිනිස් පුද්ගලයන් ලෙස සාමාන්‍යයෙහ් හැඳින්වෙන නමුදු ඕනෑම ප්‍රාණියකුගේ ආත්මය හැඳින්වීමට පුද්ගලාත්මය යන්න යොදා ගනිමු. අවශ්‍ය නම් පුද්ගලාත්ම යන්න වෙනුවට ප්‍රාණාත්ම යන්න යොදාගත හැකි ය. ධර්මාත්මය යන්න අප්‍රාණවාචී වස්තු සඳහා යෙදෙයි. ගෙය, පුටුව ආදිය ධර්මාත්ම වෙයි. ආත්මයක් නැතැයි යන්නෙහි තේරුම පුද්ගලාත්ම හෙවත් ප්‍රාණාත්ම පමණක් නොව ධර්මාත්ම ද නැතැයි කීම ය. පුටුවක් යනුවෙන් යමක් තිබේ යැයි ගැනීම ආත්මවාදී වෙයි.

එහෙත් අපි මෙතැන පුටුවක් ඇතැයි කියමු. ඒ සම්මුතියෙන් කෙරෙන්නකි. පුටුවක් ලෙස යමක් නැතිවුවත්, එසේ ගැනීම වැරදි වුවත්, අපි සම්මුතියෙන් පුටුවක් ඇතැයි ගනිමු. එහෙත් අපට අවශ්‍ය නම් පුටුවක් නැතැයි, පුටුවක් යනුවෙන් යමක් නැතැයි කිව හැකි ය. එසේ කී පමණින් පුටුවක් ඇතැයි ගම්‍ය නො වේ. පුටුවක් නැතැයි අප කියන්නේ කිසිම පුටුවක් නැතැයි යන අරුතින් මිස මෙතැන පුටුවක් නැත යන අරුතින් නො වෙයි. මෙතැන පුටුවක් සංයුක්තව නැති වුවත් සංයුක්තව එතැන පුටුවක් තිබිය හැකි ය. එබැවින් එහි දී පුටුවක් නැත යනුවෙන් කියන්නේ පුටු තිබෙන නමුත් පුටු ඇති නමුත් මෙතැන දැන් පුටුවක් නැති යන අරුතිනි. එහි දී නැතැයි කියන්නේ තිබිය හැකි පුටුවකි. වෙනත් වචනවලින් කිවහොත් එහි දී පුටුවක් නැතැයි කියන විට පුටුවක් ඇතැයි යන්න ද ගම්‍ය වෙයි.

මාර්ටින් වික්‍රමසිංහ මහතා වැනි අය අත්මයක් නැතැයි කිවහොත් ආත්මයක් ඇතැයි යන්න ද හම්‍ය වේ යැයි කියා ඇත්තේ මේ අර්ථයෙන් බව පැහැදිලි ය. එහෙත් අප ආත්මයක් නැතැයි කියන්නේ එවැනි සංයුක්ත අර්ථයකින් නො වේ. මේ ආත්මය නැතිවුව ද වෙනත් ආත්මයක් සංයුක්තව තිබිය හැකි ය යන අදහසක් එහි නැත. එහි දී කියැවෙන්නේ මේ ආත්මය මෙන් ම වෙනත් ආත්ම ද නැති බව ය. වියුක්තව ම ආත්මයක් නැත. එවිට ඒ වියුක්ත සංකල්පයට හත හැකි සංයුක්ත අවස්ථා නැත.

මෙය තවදුරටත් පැහැදිලි කරගැනීම සඳහා $x$ යන වියුක්ත විචල්‍යය ගනිමු. $x$ යනුවෙන් සංයුක්ත ව සංඛ්‍යාවක් (සංඛ්‍යා ද වෙනත් අර්ථයකින් හත්කල වියුක්ත වන බව අමතක නොකළ යුතු ය.) හෝ නිමල්, කමල් වැනි පුද්ගලයකු හැඳින්විය හැකි යැයි ද සිතමු. ඉන් කියැවෙන්නේ $x$ යන විචල්‍යයට අවස්ථාව අනුව 1, 2. 5, 4 ආදී සංඛ්‍යාවක් ද

© Prof. Nalin De Silva

නිමල්, කමල්, ආදී පුද්ගලයකු ද අගය ලෙස ගත හැකි බව ය. $x$ යන විචල්‍යය යම් අවස්ථාවක දී 4 නම් අගය නොගන්නවා විය හැකි ය. 4 නැතැයි යන්නෙන් එවිට කියැවෙන්නේ එ අවස්ථාවේ දී 4 නැති බව පමණ ය.

වෙනත් වචනවලින් කියන්නේ නම් $x$ යන විචල්‍යය 4 නම් අගය මේ අවස්ථාවේ දී නොගන්නා නමුත් 4 නම් අගය වෙනත් අවස්ථාවක ගත හැකි බවත් 4 නම් අගය දැන් නැතිවුවත් එ අගය තිබෙන බවත් ය. එවිට නැතිවන්නේ තිබෙන, තිබිය හැකි අගයකි. එබැවින් නැත යනුවෙන් කී විට ඇත යන්නක් ද ගම්‍ය වෙයි. එහෙත් $x$ යන විචල්‍යය ම නැතැයි කිවහොත් එවිට එ විචල්‍යය ගන්නා අගය පමණක් නොව විචල්‍යය ද නැති වෙයි. එවිට $x$ යන විචල්‍යයට ගත හැකි සියළු අගය නැත.

ආත්මය නැතැයි කියන්නේ එ අරුතිනි. ආත්මයට ගත හැකි සියළු අගය නැත. එ අගයට විවිධ ප්‍රාණී එකක මෙන් ම අප්‍රාණවාචී එකකද ගත හැකි ය. එ එක් අගයක් නැතැයි කියන්නේ තිබිය හැකි අගයක් නැතැයි කියන අරුතිනි. එහෙත් ආත්මයක් නැතැයි කියන්නේ තිබිය හැකි ආත්මයක් නැත යන අරුතින් නො වෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා වැන්නන් ආත්මයක් නැත්නම් ඉන් ආත්මයක් ඇතැයි ගම්‍යවන්නේ යැයි තර්ක කර ඇත්තේ වැරදි පදනමකිනි. එහෙත් නාගර්ජුනපාදයන් වහන්සේ එසේ නො වූහ. උන්වහන්සේ සසර හා නිවන යනු එකක් ම යැයි ගත්තේ එවැනි වැරදි පදනමකින් නො වේ. උන්වහන්සේ ගේ වැරැද්ද වූයේ නිවන ද සංකල්පයක් ලෙස ගැනීම ය. එ වරද අවසානයේ දී භාරතයෙන් බුදුදහම නැති වී යෑමට මග පෑදී ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva